නොසැලෙන උත්සාහය

ඔනෙලි යෙහාරා වික්‍රමසිංහ

CS CamScanner

නොසැලෙන උත්සාහය

ඔනෙලි යෙහාරා වික්‍රමසිංහ
කතෘ

කියන දේ නාහන නංගී
කතෘගේ වෙනත් කෘති

මහාමායා බාලිකා විදුහල.
7G ශ්‍රේණිය.
2026.06.09

ISBN - 978-624-211-441-5

CamScanner

පිදුම

වැටෙනා හැමවිටම යළි නැගිටින වීරිය
බාධක පැමිණියත් නොසැලෙන ගැම්මිය
සිහිනේ සැබෑ කරගන්නට ඇති ශක්තිය
උත්සාහය යි ලොව දිනනා මහා ශක්තිය

කදු හෙල් අතරමග තිබුණත් බිය නොවී
ඉදිරිය බලා යන්නට පෙරමුණ ගනීවී
වෙහෙස මහන්සිය නොතකා වැඩ කරාවී
නොසැලෙන උත්සාහය ජය මග පාදාවී

පැරදුණු තැනින් නැවතත් පණ ගසා නැගේ
පසුබට නොවී පෙරටම යයි සිහින දිගේ
ලතැවුල් දරාගෙන සිත දැඩි කරන් රැදේ
නොසැලෙන වීරිය යි ජය කණුව ළඟ රැදේ

මහ සයුරක් වුවත් දිය කරලන්න හැකී
නොසැලෙන සිතින් බාධක දිනන්න හැකී
අලසව නොසිට වෙහෙසී කරන්න හැකී
උත්සහවන්තයා හට ලොව දිනන්න හැකී

CS CamScanner

පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදූකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

CamScanner

සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

CamScanner

සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලූ දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පූරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක යුයමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළ ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සම්දු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

CamScanner

ස්තූතිය

ජීවිතයේ බාධක හමුවේ නොසැලී
ඉදිරියට යාමට මග
පෙන්වූ මගේ දෙමවුපියන්ට,
ගුරුවරුන්ට, හිතවතුන්ට හා මා
කෙරෙහි
නිරන්තරයෙන් විශ්වාසය තැබූ
සැමට මා මෙයින් ස්තූතිය පුද කර
සිටිමි.
ඔබේ දිරිගැන්මි නොවන්නට
"නොසැලෙන උත්සාහය"
සැබෑවක් කර ගැනීමට මට කිසිදා
ඉඩ නොලැබෙනු ඇත...!

CamScanner

දවසක් මම ටිකක් ඇදට වෙලා කල්පනා කරා. මගේ අධ්‍යාපනය ගැන, මගේ අනාගතය ගැන, මගේ මවුපියන් ගැන, මගේ සහෝදර සහෝදරියන් ගැන, මගේ වැඩිහිටියන් ගැන, සතුන් ගැන, සමාජය ගැන, ලෝකය ගැන මම ටිකක් තදින් කල්පනා කරා. ගොඩක් ම හිතුවෙ මම මගේ අධ්‍යාපනය ගැන. දැන් මම ඉන්නේ 7 ශ්‍රේණියෙ නිසා ටිකක් අධ්‍යාපනය ගැන දැඩි ලෙස හිතන්න වෙනවා. මම 6 ශ්‍රේණියෙ ඉද්දි පළමු වාර පරීක්ෂණයට මට ලකුණු ගොඩක් අඩුයි. ඒ කියන්නෙ සිංහලවලට එහෙම මට හතළිස් දෙකයි. දෙමළවලටත් හොඳටම අඩුයි.



CS CamScanner

ඉතින් මට එදා අම්මයි අප්පච්චියි ටිකක් සැර කළා, තදින් අවවාද දුන්නා. ඒ නිසා මම එදා අරමුණු කිහිපයක් මගේ හිතේ තියා ගත්තා. ඒ අරමුණු තමයි,

1).ඊළඟ වාර විභාගයෙන් ප්‍රශංසනීය ප්‍රගති වාර්තා ලබා ගැනීම.

2).ඊළඟ වාර විභාගයේදී පන්තියේ හොඳම දහදෙනා අතර සිටීම.

3).ඊළඟ වසරේ ත්‍යාග ප්‍රධානෝත්සවයේ සිටීම.

4).මේ පාර ගත්ත ලකුණු වලට වැඩියෙන් ඊළඟ පාර විභාගයට ලකුණු ගැනීම.

5).මගේ තියෙන නරක ගතිගුණ මකා දමා හොඳ ගතිගුණ ඇතුළත් කර ගැනීම.

මේ අරමුණු සාර්ථක කර ගැනීමට මම බලාපොරොත්තුවෙන් සිටියෙමි. 6 ශ්‍රේණියේ දෙවන වාර විභාගයත් අත ළඟ එන බව මම දන්නවා.

CamScanner

ඉතින් මම කාලසටහනක් හදා ගෙන, එදිනෙදා ලබා දෙන වැඩ එදින ම කරලා, සාමාන්‍ය දැනුම හා බාහිර දැනුම අවශ්‍ය පරිදි ලබා ගෙන, විෂය නිර්දේශයට අදාළ කරුණු හොයාගෙන, ඒ ඒ ස්ථාන වලට ගිහින් නිරීක්ෂණය කරලා වාර විභාගයට සූදානම් වුණා. මම හොඳට පාඩම් කරා. මම හිතුවේ පොත පතේ තියෙන දේවල් විතරක් පාඩම් කරලා විභාගය ලියන්න පුලුවන් කියලා. එහෙම හිතලා තමයි මම විභාගයට සූදානම් වුණේ. මම 6 ශ්‍රේණියට එද්දි නම් හිතුවෙ ඒවා හරිම ලේසියි කියලා.



CamScanner

නමුත් පළමු වාර විභාගෙට ගියාම තමා ඒක තේරෙන්නෙ.මට 6 ශ්‍රේණියෙ පළමු වාරෙට අදාළ ගොඩක් පාඩම් මග ඇරුණා. මොකද මට ඒ දවස්වල "පැපොල" කියන රෝගය වැළඳුන නිසා. මට ඒක් නිසා සති තුනක් පමණ ඉස්කෝලේ එන්න බැරි වුණා. නමුත් මම කොහොම හරි ඒ පාඩම් ටික මැඩම්ලට කියලා නැවත ඉගෙනගත්තා. නමුත් එච්චර මට තේරුණේ නෑ. අනිත් එක මම සිංහල මාධ්‍යයේ පන්තියක ඉදලා පසු ව තමා ඉංග්‍රීසි මාධ්‍ය පන්තියකට ආවෙ. කොහොම හරි මම තියෙන හොඳ ම පන්තියට වැටුණා. ඒ තමා 6G පන්තිය. ආපු ගමන් ම නම් මට යාළුවො හිටියෙ නෑ. පහුවෙලා මට හොඳ යාළුවො ටිකක් හම්බුණා. 6 ශ්‍රේණියෙ පළමු වාර විභාගයෙන් මම පන්තියේ තිස්වෙනියා. කියන්නත් ලැජ්ජයි.එතකොට තමයි මට තේරුණේ අර මම ඉස්සෙල්ලා කියපු අරමුණු ටික ක්‍රියාත්මක කරොත් හොඳයි කියලා. ගොඩක් බාධක හමුවුණා.

මම පිහිනුම්, චෙස්, බැඩ්මින්ටන් වගේ ක්‍රීඩා ගොඩක් කරා. තව ක්‍රීඩා කරා. නමුත් ඒවා මගදි නැවැත්වුවා. මේ ක්‍රීඩා එක්ක මට මගේ අධ්‍යාපනය ගොඩක් මග ඇරුණා. මොකද කිවුවොත් ක්‍රීඩා ඉවර වෙන්නෙ 4.00 ට හෝ 4.30 ට. එතකොට ඉතින් ගෙදර යද්දි 5.30 හෝ 6.00 වෙනවමයි. මේ වගේ ක්‍රීඩා ගොඩක් කරන නිසා අප්පච්චි මට කිවුවා හවසට තනියම බස් එකේ එන්න පුරුදු වෙන්න කියලා. ඉතින් මම පුරුදු වුණා. 6 ශ්‍රේණියෙ ඉදලා බස් එකේ එන්න පුලුවන් කියලා හිතනකොට මට ලොකු ආඩම්බරයක් දැනෙනවා. ක්‍රීඩා කරද්දි ගොඩක් ම අධ්‍යාපනය, නිදහස, පවුලේ සාමාජිකයන් එක්ක කතා කරන එක, නිවසේ ඉන්න කාලය ගොඩක් නැති වෙනවා. ඔහොම ඔහොම ගිහිල්ලා 6 ශ්‍රේණියෙ දෙවෙනි වාර විභාගෙට ගියා. මම කලින් පාඩම් කරපුවා ගොඩක් ම මට අමතක වුණා. මොකද මම විභාගෙ ලියන වෙලාවෙ ගොඩක් මානසිකත්වයෙන් හිටියෙ.

CamScanner

විභාගෙ කොහොම හරි ලිව්වා.ලකුණු දෙනකොට නම් දාඩියකුත් දැම්මා. හරි ම බයයි. ලකුණු දුන්නා. මෙන්න මේ විදිහට තමා දෙවෙනි වාරෙ මගේ ලකුණු තිබ්බෙ:-

1).ඉංග්‍රීසි - 96%
2).සිංහල - 84%
3).බුද්ධ ධර්මය - 90%
4).ඉතිහාසය - 80%
5).පුරවැසි අධ්‍යාපනය - 64%
6).විද්‍යාව - 83%
7).භූ ගෝලය - 93%
8).සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය - 82%
9).ගණිතය - 87%
10).දෙමළ - 81%
11).ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා-89%
12).බටහිර සංගීතය - 93%
13).බාහිර නිපුණතා - 75%

මට මුළු ලකුණු තිබ්බා 1097 ක්. මම පන්තියෙ 17 වෙනියා. නමුත් මගේ අවාසනාවන්තකමකට ප්‍රශංසනීය ප්‍රගති වාර්තාව ලබා ගන්න බැරි වුණා.

CS CamScanner

ඒ බැරි වුණේ 1 ලකුණකින්. මට තිබ්බෙ 84.45 ක ප්‍රතිශතයක්. නමුත් ප්‍රශංසනීය ප්‍රගති වාර්තා ගන්න නම් 84.5 ක් තියෙන්න ඕනෙ. දෙවෙනි වාරෙත් බැරි වුණා. පන්තියේ හොඳම දහදෙනා අතර ඉන්නත් බැරි වුණා. ත්‍යාග ප්‍රධානෝත්සවයේ සිටීමේ අවස්ථාවත් නැති වුණා. නමුත් පළමු වාරෙට වැඩියෙන් මේ වාරෙ ලකුණු ගන්න නම් පුලුවන් වුණා. ඒ අරමුණ නම් සාර්ථක වුණා. එදා ඉදන් ම තුන්වෙනි වාරෙට පාඩම් කළා. ඔක්තෝබර් මාසෙ ඉදලා නොවැම්බර් මාසෙ වෙනකන් හොඳට පාඩම් කරා. නොවැම්බර් මාසෙ තමා දිට්වා සුළි කුණාටුව ආවෙ. නොවැම්බර් 24, 25, 26 ටිකක් වැස්සා. 27, 28, 29, 30 තමයි හොඳට ම වැස්සෙ. මම ඒ දවස් ටිකේ පාඩම් කර කර ඉද්දි වැස්ස පටන් ගත්තා. ඒත් මම පාඩම් කරා. ඊට පස්සෙ 26 වෙන්දා උදා වුණා. හවස් වෙනකොට හොඳටම වැස්සා. අපි බය වුණා. ඔහොම කල්පනා කර කර ඉද්දි එක පාරටම කරන්ට් එක ගියා. අපි තවත් බය වුණා.

CamScanner

ගොරවනවා, අකුණු ගහනවා, වහිනවා. ඒත් මම ඉටිපන්දන් පත්තු කරගෙන පාඩම් කරා. නමුත් ඊට පස්සෙ අපේ ගෙදරට ටිකක් එහා කන්ද නාය ගියා. අපි ඉන්නෙත් කන්දක. අපිත් බයෙන් හිටියෙ අපේ ගෙදරත් නාය යයි කියලා.

ඒ දවස් ටිකේ නම් මම පාඩම් කරේ නෑ. අපිට ගොඩක් කරදර සිද්ධ වුණා. අපි ගොඩක් බයෙන් හිටියේ. අපේ පාරවල්, නගරය වැනි දේවල් ඔක්කොම නාය ගිහිල්ලා. සමහර ගමේ මිනිස්සුත් නාය ගිහිල්ලා. අපිට කොහෙටවත් යන්න බැරුව හිටියේ. කොයි වෙලේ නාය යයිද කියලා දන්නෙ නෑ.

ෆෝන්වල චාර්ජ් නෑ. චාර්ජ් කරන්න විදියක් නෑ. සිග්නලුත් නෑ. ඒ දවස් ටික ගෙවිලා ගියා. ආපහු කරන්ට් එකත් ආවා. එතකොට නම් සතුටක් දැනුණා. ආයෙමත් පාඩම් කරන්න පටන් ගත්තා. හැබැයි එතකොටම ෆෝන් එකට පණිවිඩ ගොඩක් ආවා. අසුබ පණිවිඩයකුත් තිබ්බා. ඒ පණිවිඩේ දකිද්දි මම පාඩම් කර කර හිටපු පොතත් පැත්තකට දාලා ටිකක් දුක් වුණා. ටිකක් නෙවෙයි, ගොඩක් දුක් වුණා. ඒ පණිවිඩේ මොකක්ද දන්නවද, ඒ තමයි 6 ශ්‍රේණියෙ තුන්වෙනි වාර විභාගෙ නැහැ කියලා. දිට්වා සුළි කුණාටුව නිසා ලංකාවේ ගොඩක් මිනිසුන් නැති වුණා. අතුරුදහන් වුණා. ගොඩක් කරදරවලට මුහුණ දෙන්න ඒ ගොල්ලොන්ට සිද්ධ වුණා. ඉතින් අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කරලා තියෙනවා මේ තුන්වෙනි වාර විභාගය නැති කරන්න. ඉතින් ඒ වෙලාවේ මම හිතුවා අපරාදෙ මෙච්චර පාඩම් කළේ කියලා. කමක් නෑ කියලා හිතුණා. ඔහොම්ම 7 ශ්‍රේණියට ළඟා වුණා.

මේ පාර 7 පන්තියට යද්දි නම් මම හිතුවේ නෑ මේ අධ්‍යාපනය ලේසි වෙයි කියලා. මොකද ගිය පාරත් මම හිතුවෙ එහෙම නෙ. 7 ශ්‍රේණියට ගියා. ටික ටික ඒ පාඩම් ඉගෙන ගද්දි හරි ආස හිතෙනවා. 6 ශ්‍රේණියෙ දි නම් මම හිතුවෙ ඒ පාඩම් හරිම අමාරුයි කියලා. නමුත් 7 ශ්‍රේණිය නම් එහෙම නෑ. 7 ශ්‍රේණිය පළමු වාර විභාගෙ ළං වුණා. හැම දෙයක් ගැනම කල්පනා කරලා හොඳට හිතලා බැලුවා. මම බය වුණේ නෑ මේ විභාගෙ ලියන්න. මොකද අපි හැම වෙලේ ම හොඳ දේවල් හිතන්න ඕනෙ (Positive Thinking). විභාගෙට මුහුණ දුන්නා.

CamScanner

මේ පාර නම් හැම දෙයක් ම මම හොඳට බලා ගත්ත නිසා වැඩිය අමාරු වුණේ නෑ. ගිය පාර නම් පේපරේකට දීලා තියෙන මුළු වෙලාවම ගියා මට ඒ පේපරේම ලියන්න. නමුත් මේ පාර නම් පැයක් විතර මම නිකන් හිටියෙ. ඒ තරම් ම මේ පාර ලේසියි පේපර් ටික. ලකුණු දෙන්න පටන් ගත්තා. මෙන්න මේ විදිහට තමයි මට මේ පාර ලකුණු තිබ්බෙ:-

7 ශ්‍රේණිය පළමු වාර විභාගයේ ලකුණු.

1).ඉංග්‍රීසි - 93%
2).සිංහල - 80%
3).බුද්ධ ධර්මය - 80%
4).ගණිතය - 96%
5).විද්‍යාව - 85%
6).පුරවැසි අධ්‍යාපනය - 88%
7).භූ ගෝලය - 90%
8).ඉතිහාසය - 96%
9).සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය - 92%
10).දෙමළ - 92%
11).ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා - 91%
12).බටහිර සංගීතය - 98%
13).බාහිර නිපුණතා - 100%

CamScanner

මට හරිම සතුටුයි. මට මුළු ලකුණු 1181ක් තිබ්බා. මගේ ප්‍රතිශතය වන්නේ 90.84. මම පන්තියෙ 9 වෙනියා. මට හිතා ගන්නවත් බෑ. එක්කෙනෙක් දෙන්නෙක් නම් හොර කළා. මට ඒවා වැඩක් නෑ. කොහොම හරි මම හොඳ ලකුණක් ගත්තනේ. මම මේ උඩ සඳහන් කරේ බොරු ලකුණු නෙවෙයි හරිද. මේකෙන් ආදර්ශයක් ගන්න ඔයාලට මොකටද මම බොරු කියන්නේ. මේ ලකුණු ගැන නම් මට හරිම සතුටුයි.

CamScanner

"පැකිළුණත් නොවැටී, වැටුණත් නොනැවතී, පෙරටම යන මිනිසත්කමේ මහා බලය උත්සාහයයි. කටුක මාර්ග, අභියෝග සහ පරාජයන් හමුවේ වුව ද, නෙතින් නොදුටු ඉලක්කයක් වෙනුවෙන් සිතින් නොසැලී වෙහෙසෙන ඒ හදවතට ලෝකයේ උසස් ම උපහාරය හිමි විය යුතු ය. සැබෑ ජයග්‍රහණය ඇත්තේ ගමනාන්තයේ පමණක් නොවේ, පසුබෑමක් හමුවේ වුව ද නැවත නැඟී සිටීමට ඔබ ගන්නා ඒ "නොසැලෙන උත්සාහය" තුළයි! ජීවිතයේ මුහුණ දීමට සිදු වූ අප්‍රමාණ බාධක සහ අභියෝග හමුවේ කිසිවිටෙකත් අධිෂ්ඨානය අත්නොහැර, නොසැලෙන උත්සාහයෙන් පෙරටම ගිය ඔබේ අප්‍රතිහත උත්සාහය සැබැවින්ම ප්‍රශංසනීය යි.

CamScanner

අන් අය පසුබසිද්දී, ඔබ ඔබේ සිහිනය කෙරෙහි පමණක් විශ්වාසය තබා, අතිමහත් කැපවීමෙන් සාර්ථකත්වයේ මාවත සකසා ගත්තේ ය. වැටුණු සෑම අවස්ථාවකම ඊට වඩා ශක්තිමත් ව නැගී සිටීමට ඔබ දැක් වූ ඒ නොබසුබට ගුණය, ජීවිතය ජය ගැනීමට වෙර දරන සැමට මහගු ආදර්ශයකි. ඔබේ ඒ අද්විතීය කැපවීමට සහ අභිමානවත් ගමනට මාගේ හෘදයාංගම උපහාරය මෙසේ පිදුම් කරමි. නොසැලෙන උත්සාහය, ජීවිතයේ ඕනෑ ම අභියෝගයක් ජය ගැනීමට අවශ්‍ය ප්‍රධානතම ශක්තිය යි."

CamScanner

වැටෙනා හැම විටම නොසැලී නැගිටින්න
කටුක විලස ආ බාධක සිඳලන්න
සිතේ ශක්තියෙන් පෙරටම පියනගන්න්
මෙපොත පුදයි උත්සහවන්ත ඔබටයි
කියවන්න

මග අහුරා ආ අභියෝගයන් හමුවේ
පසුබට නොවී නොසැලී සිටි ඒ සැදෑවේ
සැබෑ කරනු වස් තමුන්ගේ සිහින
ලොවේ
වෙහෙසෙන සැමට මෙම පොත
කියවන්න සුවේ

දක්ෂතාවයට වඩා වෙහෙස මහන්සිය
ජයමග තනන බව ලොවටම පෙන්වසිය
නොසැලෙන දිරිය සිත තුළ රදවා රසිය
කියවන්න මෙපොත දිරිමත් මිනිසුන්
දෙසිය

අඳුරු කලාපයක අතරමංවී සිටිනා
එළියක් සොයන්නට වෙර වීරිය දරනා
ජීවිත ජයගන්න මගපෙන්වීම පතනා
ආදරණීය පාඨක ඔබටයි මෙපොත
පිදෙනා

කදුළු පිරුණු මාවත්වල අත නොහැරී
වැටෙන කඩඉමේ ශක්තිය දුන් නොපැරී
මගේ ගමන අද මේ ලෙස නිමවෙද්දී
පුදමි මෙපොත මට දිරි දුන් සැමට සරී

CamScanner

පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

CS CamScanner

නිමි...

CamScanner